පොලිස් මූලස්ථානය, කොළඹ, ශ්‍රී ලංකාව
பொலிஸ் தலைமையகம், கொழும்பு, இலங்கை
POLICE HEAD QUARTERS, COLOMBO, SRI LANKA

තැ. පෙ. අංකය / த. பெ .இல. / P. O. Box No. 517

ෆැක්ස් / தொலைநகல் / Fax No. 011- 2329500

දුරකථනය / தொலைபேசி / Telephone 011-2384024 011-2395605

Website: www.police.lk

ඊ - මේල් / மின்-அஞ்சல் / E-Mail Policemedia@police.lk

මගේ අංකය / எனது இல. / My No. PMD / PR /1383 / 21

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021.10.27
පැය 1630

# මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

## මනුෂ්‍ය ඝාතනයක් සිදු කළ සැකකරුවකු පිළිබඳ සාර්ථක තොරතුරු ලබාදෙන්නෙකුට රුපියල් ලක්ෂ 25ක ත්‍යාග මුදලක් - පොලිස් මූලස්ථානය

2021.10.26 වන දින උදෑසන 0615ට ආසන්න වේලාවකදී මුල්ලේරියාව පොලිස් වසමේ මීගහවත්ත ප්‍රදේශයේ දී සිදු කරනු ලැබූ වෙඩි තැබීමකදී එක් පුද්ගලයෙකු මිය ගොස් තවත් පුද්ගලයෙකු තුවාල ලබන ලදී. වෙඩි තැබීම සඳහා පැමිණි සැකකරුවන් සම්පූර්ණයෙන් මුහුණ ආවරණ වන සේ හිස් වැසුම් පැළැඳ යතුරුපැදියකින් පැමිණ නිවස තුළට ගොස් එම වෙඩි තැබීම සිදු කර ඇත.

මෙම මනුෂ්‍ය ඝාතනය සඳහා පැමිණි සැකකරුවන් සොයා ගැනීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය මහජන සහය පතයි. ඒ අනුව මෙහි ප්‍රධාන සැකකරු **අත්අඩංගුවට ගැනීමට අවශ්‍ය සාර්ථක තොරතුරු ලබා දෙනු ලබන පුද්ගලයෙකුට රු.2,500,000/= ක (රුපියල් විසිපන්ලක්ෂයක) මුදල් ත්‍යාගයක්** ලබා දීමට පොලිස් මූලස්ථානය විසින් කටයුතු කරනු ඇත. එසේම මේ පිළිබඳව සපයන තොරතුරු ඉතා රහසිගතව තබා ගන්නා බවද කිසිවිටෙක බාහිර පාර්ශවයකට අනාවරණය නොවන බවටද මහජනතාව වෙත අවධාරණය කරනු ලැබේ.

දැනට ප්‍රධාන සැකකරු යැයි හඳුනාගෙන ඇති පුද්ගලයා පිළිබඳ තොරතුරු පහත පරිදි ඉදිරිපත් කරමි.

**1. පෞද්ගලික තොරතුරු -:**

- සැකකරුගේ නම :- පොන්නම්පෙරුම ආරච්චිගේ දොන් දනුෂ් බුද්ධික නොහොත් ජිලේ
- වයස :- අවුරුදු 30
- ජාතික හැඳුනුම්පත් අංක:- 911854481 V
- පදිංචිව සිටින ලිපිනයන් :- 1. අංක 42/02, බාරොන් තිලකානන්ද මාවත, මුල්ලේරියාව නව නගරය.

  2. අංක 333 සී , රොබට් ගුණවර්ධන මාවත,මාලබේ.( විවාහක බිරිඳගේ ලිපිනය)

  3. අංක 252, උඩුමුල්ල, මුල්ලේරියාව.

**2. ඉහත සැකකරුගේ හඳුනා ගැනීමේ සළකුණු -:**

- සැකකරුගේ අත් දෙකෙහිම උරහිසේ සිට වැලමිට දක්වා පච්චා කොටා ඇති අතර සැකකරුගේ ඡායාරූප කිහිපයක් මේ සමඟ යොමු කරමි.

**3. සැකකරු වැඩිවශයෙන් ගැවසෙන ප්‍රදේශ -:**

- අංගොඩ , හිඹුටාන , මුල්ලේරියාව නව නගරය , වැලිගම , මිදිගම, හික්කඩුව හා ගාල්ල යන ප්‍රදේශ වල වැඩි වශයෙන් ගැවසෙන බවට තොරතුරු පවතී.

**4. සැකකරු පැමිණි යතුරුපැදියේ අංකය**

- WP XV 5432 (දැනට සොයා ගෙන ඇත)

**තොරතුරු දැනුම් දිය යුතු දුරකථන අංක -:**

1. අධ්‍යක්ෂ / කොළඹ අපරාධ කොට්ඨාසය :- 071 - 8591727<br>077 - 7370360
2. අධ්‍යක්ෂ / බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය :- 071 – 8592279

මේ පිළිබඳව මහජනතාව ශ්‍රී ලංකා පොලිසිය වෙත දක්වනු ලබන සහයෝගයට ස්තූතිවන්ත වෙමි.

පොලිස් මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,<br>
පොලිස් මූලස්ථානය.